# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)-2022

2025 - ජුලි

**BCOM E 4033 - කළමනාකරණ තොරතුරු පද්ධති**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරයි : (04) කාලය : පැය 03 යි

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්න අංක - 01

අ). තොරතුරු පද්ධතියක් යනු කුමක්ද? තොරතුරු තාක්ෂණය සහ තොරතුරු පද්ධති අතර වෙනස හඳුනා ගැනීමෙන් ඔබේ පිළිතුර කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 07)

ආ). නූතන සංවිධානවල තොරතුරු පද්ධති ඒකාබද්ධ කිරීම සහ භාවිතය හේතුවෙන් පැන නගින අභියෝග විස්තර කරන්න.

(ලකුණු 08)

ඇ). සංවිධානයක් තුළ ප්‍රධාන කළමනාකරණ මට්ටම්වලට යොදා ගැනෙන ප්‍රධාන ආකාරයේ තොරතුරු පද්ධති හඳුනාගෙන සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක - 02

අ). ව්‍යාපාරයක් තුළ ක්‍රියාත්මක වන තොරතුරු පද්ධතිවල කාර්යභාරය කුමක්ද? කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 07)

ආ). උදාහරණයක් භාවිතා කරමින් දත්ත සහ තොරතුරු අතර වෙනස හඳුනා ගන්න.

(ලකුණු 08)

ඇ). උපායමාර්ගික ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපාරික සමාගම් තොරතුරු පද්ධතිවල විශාල වශයෙන් ආයෝජනය කරයි. එම අරමුණු පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 25)

ප්‍රශ්න අංක - 03

අ). විද්‍යුත් වාණිජ්‍යය යනු කුමක්ද? කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 03)

ආ). විද්‍යුත් වාණිජ්‍යය පරිසරයේ ප්‍රධාන ආරක්ෂක තර්ජන තුනක් (3) හඳුනාගෙන කෙටියෙන් පැහැදිලි කරන්න?

(ලකුණු 06)

ඇ). සාම්ප්‍රදායික වාණිජ්‍යයට සාපේක්ෂව විද්‍යුත් වාණිජ්‍යයේ අද්විතීය ලක්ෂණ හතරක් (04) පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඈ). විද්‍යුත් වාණිජ්‍යය භාවිතා කිරීමෙන් ව්‍යාපාරවලට ලබා ගත හැකි ප්‍රතිලාභ හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක - 04

අ). දත්ත සමුදායක් යනු කුමක්ද? කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 04)

ආ). හොඳ (වැදගත්) තොරතුරු වල ඕනෑම ලක්ෂණ හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ). දත්ත සමුදා ආරක්ෂාව සහතික කිරීම සහ අනවසර ප්‍රවේශය වැළැක්වීම සඳහා හොඳම භාවිතයන් මොනවාද? කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ඈ). සාම්ප්‍රදායික ස්වාධීන පද්ධතිවලට වෙනස්ව දත්ත සමුදා කළමනාකරණ පද්ධති (DBMS) වල වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 25)**